ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | **සංඛ්‍යාන දෙපාර්තමේන්තුව** |
|---|---|
| දිනය | **2012 / 05 / 31** |

## 2012 මැයි මාසයේ උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/07=100) මගින් මනිනු ලබන උද්ධමනය, වාර්ෂික සාමාන්‍ය පදනම මත 2012 අප්‍රේල් මාසයේ පැවති සියයට 5.7 හි සිට මැයි මාසයේ දී සියයට 5.6 දක්වා පහළ වැටුණු අතර, ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය පූර්ව මාසයේ පැවති සියයට 6.1 හි සිට මැයි මාසයේ දී සියයට 7.0 දක්වා ඉහළ නැගිණි. මීට අමතරව, 2012 අප්‍රේල් මාසය හා සසඳන විට මැයි මාසයේ දී මූලික උද්ධමනය, වාර්ෂික සාමාන්‍යය හා ලක්ෂ්‍යමය යන දෙයාකාරයෙන්ම පිළිවෙළින් සියයට 6.0 සහ සියයට 4.8 දක්වා පහළ වැටිණි.



දර්ශකයෙන් පෙන්නුම් කෙරෙන පරිදි 2012 මැයි මාසයේ දී පූර්ව මාසයට සාපේක්ෂව සාමාන්‍ය මිල මට්ටමෙහි සියයට 1.4 ක ඉහළ යාමක් වාර්තා වූ අතර, කො.පා.මි. දර්ශකය නිරපේක්ෂ වශයෙන් 159.8 සිට 162.1 දක්වා ඉහළ නැගිණි. දර්ශකයේ මාසික ඉහළ යාම කෙරෙහි ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් කාණ්ඩයේ මිල ගණන් සියයට 2.5 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ආහාර නොවන කාණ්ඩයේ මිල ගණන් ද සියයට 0.6 කින් ඉහළ නැගිණි. තිරිඟු පිටි, පාන් හා කිරිපිටි මිල ඉහළ නංවමින් කළ සංශෝධන සහ සෘතුමය සාධක හේතුවෙන් එළවළු, දෙහි, අමු මිරිස්, රතු ළූණු, අර්තාපල් සහ මත්ස්‍ය හා මුහුදු ආහාරවල මිල ගණන් ඉහළ යාම කො.පා.මි. දර්ශකයේ ඉහළ නැගීම සඳහා දායක විය. කෙසේ වුවද, පළතුරු, පළා වර්ග, ලොකු ළූණු, බිත්තර සහ සීනි ආදියෙහි මිල ගණන්වල පහළ යාමක් වාර්තා විය. ආහාර නොවන කාණ්ඩයෙහි නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන (සියයට 1.2 කින්); රෙදිපිළි හා පාවහන් (සියයට 0.8 කින්); විවිධ භාණ්ඩ හා සේවා (සියයට 0.5 කින්); අධ්‍යාපන (සියයට 0.3 කින්); ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ නඩත්තු (සියයට 0.3 කින්); සහ ප්‍රවාහන (සියයට 0.1 කින්) යන උප කාණ්ඩවල මිල ගණන් ඉහළ නැගිණි. මේ අතර, සෞඛ්‍ය, සන්නිවේදන සහ විනෝදාත්මක හා සංස්කෘතික යන උප කාණ්ඩයන්හි මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.